මාධ්‍ය නිවේදන - අංක 30

මැතිවරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තු මැතිවරණය - 2020 අගෝස්තු 05

තැපැලෙන් ඡන්දය දීම

2020 අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී තැපැලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම්පත්‍ර 753,037 ක් ලැබී තිබේ. එම ඉල්ලුම්පත්‍ර අතරින් 705,085 ක් පිළිගෙන ඇති අතර, 47,430 ක් ප්‍රතික්ෂේප කර තිබේ.

02. එම ප්‍රතික්ෂේපිත අයදුම්පත්‍ර අතුරින් වැඩි ප්‍රමාණයක් ඡන්ද විමසීම් දින ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි සඳහා යෙදවීමට අපේක්ෂා නොකරන කාණ්ඩවලට අයත් රජයේ නිලධාරීන්ගේ ඉල්ලුම්පත්‍ර වේ. එකම තැනැත්තෙකු විසින් ඉල්ලුම්පත්‍ර එකකට වැඩි සංඛ්‍යාවක් සේවා ස්ථාන දෙකකින් ඉදිරිපත් කිරීම, තොරතුරු ප්‍රමාණවත් නොවීම, තොරතුරු නිවැරදි නොවීම යනාදි හේතු නිසා ද ඉල්ලුම්පත්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී ඇති අතර, ඡන්ද විමසීම් කාර්යයට යොදවන නිලධාරීන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප වී නොමැත.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020 ජුනි මස 23